2024

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report



ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
தேசிய நூதனசாலைகள் திணைக்களம்
Department of National Museums

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசன, மத மற்றும் கலாச்சார விவகார அமைச்சு

Ministry of Buddhasasana, Religious and Cultural Affairs

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 208

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ 07

(01). ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය:

1.1. හැඳින්වීම:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොට ම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, හම්බන්තොට මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හා පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර ප්‍රදර්ශන සහ දේශන හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර:

(අ). ආයතනයේ දැක්ම:

දැනුම සහ ආස්වාදයෙන් පරිපූර්ණ අර්ථවත් කෞතුකාගාර සේවාවක් මහජනතාව වෙත ලබා දීම.

(ආ). ආයතනයේ මෙහෙවර:

සංස්කෘතික සහ ස්වභාවික උරුමය පිළිබිඹු කෙරෙන කෞතුක භාණ්ඩ සහ නිදර්ශක අත්පත් කරගැනීම, එක්රැස් කිරීම, විධිමත්ව ලේඛණගත කිරීම, විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම සහ එම එකතූන් සහ දැනුම පර්යේෂණ, අධ්‍යයන, අධ්‍යාපන අරමුණු සහ රසාස්වාදය උදෙසා ඵලදායී ලෙසත් ආකර්ශනීය ලෙසත් මහජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම.

1.3. කාර්යභාරය

- පුරාවිද්‍යාව, මානව වංශ විද්‍යාව, මානව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව සහ භූ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කෞතුක භාණ්ඩ සහ නිදර්ශක රැස් කිරීම, ලේඛනගත කිරීම සහ ආරක්ෂා කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කොළඹ ජාතික කෞතුකාගාරය ඇතුළු කෞතුකාගාර එකොළහක ස්ථිර ප්‍රදර්ශන යාවත්කාලීනව පවත්වා ගැනීම, ආරක්ෂාව තහවුරු කිරීම සහ දෛනික නඩත්තු සහ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම.
- සංරක්ෂිත පැරණිතම ග්‍රන්ථ සහ පුස්කොළපොත් එකතුවක් සහිත ජාතික කෞතුකාගාර පුස්තකාලය මගින් පර්යේෂකයන් සඳහා ඵලදායී විමර්ශන සේවාවක් ලබාදීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශයට පත්කිරීම.
- ස්පෝලියා සෙලනිකා නැමති පර්යේෂණ සංග්‍රහය, කෞතුකාගාර එකතූන්ට අදාළ පර්යේෂණ සහ නාමාවලි, දෙපාර්තමේන්තු ප්‍රකාශන ලෙස මුද්‍රණය වී තිබෙන විරල ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව දැනුම වර්ධනය කිරීම සඳහා දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සහිත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල විද්‍යාර්ථීන් සඳහා කෞතුකාගාර විද්‍යාව පිළිබඳ දැනුම ලබාදීම සඳහා සම්පත් දායක ආයතනය ලෙස කටයුතු කිරීම.
- නීතිමය කටයුතු සඳහා සත්ත්ව ආදර්ශක හඳුනාගැනීමට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.
- බාහිර ආයතන විසින් කෞතුකාගාර ස්ථාපනය කිරීමේදී උපදේශන සේවා ලබාදීම.
- ආකර්ෂණීය කෞතුකාගාර සේවාවක් ලබාදීම තුළින් දෙස් විදෙස් කෞතුකාගාර නරඹන්නන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් ජාතික ආදායමට දායකත්වයක් ලබාදීම.

1.4. සංවිධාන සටහන: (ඇමුණුම: 01 බලන්න)

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

(අ). දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

- මානවවංශ විද්‍යා අංශය

- මානව විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- ජාතික කෞතුකාගාර පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය
- සංරක්ෂණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඡායාරූප අංශය
- ප්‍රදර්ශන සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

(ආ). දෙපාර්තමේන්තුවේ යටතේ පාලනය වන කෞතුකාගාර:

- කොළඹ ජාතික කෞතුකාගාරය
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය කොළඹ
- මහනුවර ජාතික කෞතුකාගාරය
- රත්නපුර ජාතික කෞතුකාගාරය
- ගාල්ල ජාතික කෞතුකාගාරය
- ඕලන්ද කෞතුකාගාරය පිටකොටුව
- ජන කෞතුකාගාරය අනුරාධපුරය
- සමුද්‍ර කෞතුකාගාරය ගාල්ල
- නිදහස් අනුස්මරණ කෞතුකාගාරය කොළඹ
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හම්බන්තොට
- පුරාණ තාක්ෂණ කෞතුකාගාරය පොළොන්නරුව

(02). ප්‍රගතිය හා ඉදිරි දැක්ම:

ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක:

(අ). ජයග්‍රහණ:

- 2024 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත වාර්ෂික ආදායම වූයේ රු. මිලියන 125 කි. එහෙත් මේ වසරේදී රු. මිලියන 132.436 ක වාර්ෂික ආදායමක්

ලබාගැනීමට අපට හැකියාව ලැබුණි. ඒ අනුව අපේක්ෂිත ආදායමට වඩා මිලියන 32.436 ක වැඩි ආදායමක් ලබා ගැනීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයකි.

- මේ වසරේදී කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින කෞතුකාගාර නරඹන්නන්ගේ සංඛ්‍යාව 575,412 කි. එය පසුගිය වසර හා සැසඳීමේදී 20% ක වර්ධනයකි.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සඳහා නව ආකර්ෂණීය වෙබ් අඩවියක් සහ කෞතුක භාණ්ඩ එකතුන්ට අදාල දත්ත පද්ධතියක් සකස් කරන ලදී.
- නැඳුන්ගමුව විජය රාජා හස්තියාගේ සංරක්ෂිත අනුරුව ප්‍රතිනිර්මාණය කර අවසන් කරන ලදී. මේ සඳහා රු. මිලියන 06 ක් වියදම් විය.
- මේ වසරේදී ජාතික කෞතුකාගාර පුස්තකාලය සඳහා ගිණි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට හැකි විය. එම ව්‍යාපෘතියේ වියදම රු. මිලියන 218 කි.
- අනුරාධපුර ජන කෞතුකාගාර ගොඩනැගිල්ලේ සංරක්ෂණමය නවීකරණ කටයුතු අවසන් කරන ලදී. මේ සඳහා වියදම රු. මිලියන 111 කි.
- පිටකොටුව, කුමාර වීදියේ ඕලන්ද කෞතුකාගාරයේ කෞතුකාගාර ප්‍රදර්ශන නවීකරණය කර මහජනතාව සඳහා විවෘත කරන ලදී. මේ සඳහා වැය වූ මුදල රු. මිලියන 15 කි.
- ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ද ලබා ගනිමින් ගාල්ල ජාතික කෞතුකාගාරයේ වහලයේ සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. මේ සඳහා වූ වියදම රු. මිලියන 03 කි.
- පෞරාණික ස්මාරකයක් වූ කොළඹ ජාතික කෞතුකාගාරයේ ඉදිරිපස සහ නැගෙනහිර තාප්පයේ සංරක්ෂණ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේ විදුලි පද්ධතිය නවීකරණය කරන ලදී. වියදම රු. මිලියන 03 කි.
- කොළඹ ජාතික කෞතුකාගාරය සඳහා නව ගෘහ භාණ්ඩ මැදිරියක් ස්ථාපිත කරන ලදී, මේ සඳහා රු. මිලියන 03 ක් වියදම් වී ඇත.
- පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයට අනුබද්ධිත ඉටි ප්‍රතිමා කෞතුකාගාරයේ වහලයේ අලුත් වැඩියා කටයුතු සිදු කරන ලදී. මෙහි වියදම රු. මිලියන 10 කි.
- මේ වසරේදී කෞතුකාගාර පර්යේෂණ සමුළුවක් පැවැත්වීමට හැකි විය.
- දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීමට හැකිවිය.
    - ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ කලා සහ ශිල්ප ආනන්ද කුමාරස්වාමි
    - සර්ප වෙදකම (සම්). ප.එ.ප. දැරණියගල
    - කෞතුක වස්තු සංරක්ෂණ මූලධර්ම ඕ.පී. අග්‍රවාල්, (පරි). සිරිනිමල් ලක්දුසිංහ

(ආ). අභියෝග හා ඉදිරි ඉලක්කඃ

- 2025 වසර සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත වාර්ෂික ආදායම වන රු. මිලියන 150 ක ඉලක්කය සපුරා ගැනීම.
- වාර්ෂික නරඹන්නන් සංඛ්‍යාව ලක්ෂ 06 දක්වා වර්ධනය කර ගැනීම.

- 'ස්පෝලියා සෙලනිකා 53 වෙළුම' පර්යේෂණ ග්‍රන්ථය, 'කෞතුකාගාර සඟරාව 22 කලාපය' සහ 'කොළඹ ජාතික කෞතුකාගාර මාර්ගෝපදේශ' ග්‍රන්ථය (සිංහල හා ඉංග්‍රිසි) මුද්‍රණය කිරීම
- දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතියට අනුව පහත ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීම,
    - වෛද්‍යක සාර්ථ සංග්‍රහය
    - සර්ප වෙද පොත
    - කොළඹ කෞතුකාගාර සියවස කලාපය (සිංහල)
    - කොළඹ කෞතුකාගාර සියවස කලාපය (දෙමළ)
    - Andrew Nicholl Water Colour Painting

.....

සනූජා කස්තුරිආරච්චි

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්

සනූජා කස්තුරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	කණ්ඩායම 2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		458,548,026	298,077,030	ඒසිඒ-3
-	නැන්පතු		13,989,343	36,373,198	ඒසිඒ-4
8,000,000	අත්තිකාරම් ගිණුම්		15,452,219	15,784,626	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
8,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		487,989,588	350,234,854	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		487,989,588	350,234,854	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	30,000,000	
8,000,000	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		487,989,588	320,234,854	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
247,157,200	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	223,535,546	196,461,389	
109,934,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	99,061,592	74,830,967	ඒසිඒ-2(ii)
1,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,092,104	1,397,175.24	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
358,791,200	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		323,689,243	272,689,531	
	මූලධන වියදම්				
184,600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	122,651,922	65,202,050	
199,541,886	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	197,756,062	53,398,977	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	498,434	319,760	
15,000,000	වෙනත් මූලධන වියදම්	15	13,612,497	2,829,639,348	
399,641,886	මුළු මූලධන වියදම් (උ)		334,518,915	2,948,560,135	
	නැන්පතු ගෙවීම්		6,772,773	5,901,553	ඒසිඒ-4
20,000,000	අත්තිකාරම් ගෙවීම්		21,801,428	21,179,774	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
20,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		28,574,201	27,081,327	
778,433,086	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		686,782,358	3,248,330,993	
(770,433,086)	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(198,792,770)	(2,928,096,139)	
	නොපිය වූ අග්‍රිම ශේෂය		687,338	-	
	අග්‍රිම ඇලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(202,355,526)	(2,929,980,157)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		2,875,418	1,884,017	ඒසිඒ-3
			(198,792,770)	(2,928,096,139)	

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කළඹ 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	15,731,295,275	15,190,271,872
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	53,350,245	47,001,036
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**15,784,645,520**	**15,237,272,908**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,286,967	3,155,328
දේපළ පිරියත හා උපකරණ සංචිතය		15,731,295,275	15,190,270,872
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රාග්ධන වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	51,063,278	43,846,708
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**15,784,645,520**	**15,237,272,908**

පිටු අංක.01.....සිට ..45.. දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..46.. සිට ..55... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025/02/24

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 21.02.2025

සනූජා කස්තූරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 21/02/2025

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
බුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	146,710,387	92,330,853
අග්‍රිම් ලැබීම්	458,548,026	298,077,030
අත්තිකාරම් අයකර ගැනීම්	15,221,808	12,796,171
නැන්පතු ලැබීම්	13,989,343	36,373,198
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	634,469,564	439,577,252
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	321,517,513	270,514,246
සහනාධාර සහ මාරුකිරීම්	1,092,104	1,397,175
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	48,125,400	9,294,933
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	2,875,418	31,884,017
අත්තිකාරම් ගෙවීම්	21,804,778	21,419,327
නැන්පතු ගෙවීම්	6,772,773	5,901,553
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	402,187,986	340,411,253
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	232,281,578	99,165,999
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	231,594,240	99,165,999
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	231,594,240	99,165,999
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(231,594,240)	(99,165,999)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	687,338	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	687,338	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන් :

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20039900	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	96,000	129,000	128,696	107.24%
20020101	රජයේ ගොඩනැගිලි කුලී	1,640	1,640	5,377	327.86%

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	334,000,000	358,791,200	323,689,243	90.22%
ප්‍රාග්ධන	371,000,000	399,641,886	334,518,915	83.79%

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		

01	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	බහුකාර්ය සංවර්ධන සහායකයින් සඳහා වැටුප් ගෙවීම				
		130-01-02-0-1001	25,571,625	25,571,625	23,688,770	98.64%
		344-01-01-1003	25,501,350	25,571,625	23,587,965	92.50%

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ٪ ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	969,186,125.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	3,160,590,048.07	-	-
9153	ඉඩම්	-	11,568,705,389.92	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	6,301,553.03	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරෙමින් පවතින වැඩ	-	26,512,159.48	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
CAA/B/NM/223/2024/FA

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2025 මැයි 19 දින

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
20 MAY 2025
පිළිගත් අංකය

ගණන්දීමේ නිලධාරී,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

උක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් මේ සමඟ එවමි.

ආර්.එස්.කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට

පිටපත්:- 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව (විගණිත මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා සම්පිණ්ඩන වාර්තාවේ පිටපතක් මේ සමඟ එවමි.)

2. ලේකම්, බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. CAA/B/NM/223/2024/FA

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

2025 මැයි 19. දින

ගණන්දීමේ නිලධාරී
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
20 MAY 2025
කියවූ අංකය

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) හෙක්ටයාර 4.6317 ක ජාතික කෞතුකාගාර ඉඩම් හා ගොඩනැගිල්ල 2013 වර්ෂය පදනම් කරගෙන රු.10,800,000,000 කට තක්සේරු කර තක්සේරු වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණ ද මෙම දේපළ තක්සේරු කර 2024 වර්ෂය වන විට වසර 11 ක කාලයක් ගතවී ඇතත් කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ (2) ඡේදයේ සඳහන් පරිදි ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර වන නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය සහ ගාල්ල ජාතික කෞතුකාගාරය සම්බන්ධයෙන් වූ ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරාගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල ACA 02 ආකෘතිය තුළ මෘදුකාංග සංවර්ධනය සඳහා විගණිත වර්ෂය තුළ වැය කරන ලද වටිනාකම් රු.3,778,343 ක් වුවද, පරිගණක මුද්‍රිත SA 82 ආකෘතිය අනුව මෘදුකාංග සංවර්ධනය සඳහා මිලදී ගැනීම් ලෙස රු.3,870,023 දක්වා තිබුණු අතර, එහි වෙනස රු.91,680 ක් විය.

(ඈ) මූල්‍ය කාර්යසාධන වාර්තාව අනුව 2024 වර්ෂය තුළ මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම් රු.197,756,061 ක් වුවද, ACA 6 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් රු.193,283,076 කි. ඒ අනුව වෙනස රු.4,467,985 කි. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාගෙන ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත රු.4,564,665 ක වටිනාකමින් යුතු මානව විද්‍යා අංශය සඳහා ගබඩා අල්මාරි 02 ක් පුස්තකාල අල්මාරි 04 ක් කෞතුක භාණ්ඩ ප්‍රදර්ශන අල්මාරි 06 ක් 2024 විගණිත වර්ෂය තුළ ලබාදී ඇති නමුත්, අදාළ වත්කම් 9152 වත්කම් ශීර්ෂය යටතේ ACA-6 ආකෘතිය මඟින් ප්‍රාග්ධනිත කර නොතිබුණු නිසා මෙම වෙනස ඇති වී තිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

(අ) 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ACA 03) තුළ මුදල් මඟින් අග්‍රිම් පියවීම් යටතේ වසර අවසානයේ භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශනය (ACA 03) තුළ 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.3,562,756 ක් ලෙස පෙන්නුම් කළද, වසර අවසන් අග්‍රිම ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ පසු නිවැරදි ශේෂය රු.687,338ක් වූයෙන් වෙනස රු.2,875,418 ක් විය.

(ඇ) 2024 දෙසැම්බර් 16 දිනැති අංක 6/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් පරිදි විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ACA – F) වසර අවසානයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.2,875,418 ක වටිනාකම උක්ත වක්‍රලේඛයේ 7.4 ඡේදයේ උපදෙස් පරිදි භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) ලෙසින් අන්තර්ගත කර නොතිබුණු අතර, එම ශේෂය 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ ඇතුළත් කර තිබුණි. මේ අනුව ඉදිරිපත් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුදල් පොත පියවා මුදල් ශේෂය ප්‍රේෂණය කිරීම නිවැරදි ලෙසින් ගිණුම මඟින් පෙන්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය තුළ විදේශ ප්‍රදාන ලෙස යුනෙස්කෝ ආයතනය වෙතින් කොහා පරිගණක මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී තිබූ USD 1,500 ක වටිනාකම වූ රු.475,886 ක මුදල ACA 2 (iv) වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශයෙහි හා ACA 2 (v) එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය යන ආකෘතීන්හි විදේශ ප්‍රදාන මූලධන යටතේ සටහන් කරනු වෙනුවට දේශීය අරමුදල් මූලධන යටතේ ලද ප්‍රතිපාදන රු.475,886 ක් හා දරන ලද වියදම රු.312,626 ක් ලෙස සටහන් කර තිබුණි.

(ආ) පුනරාවර්ථන වැය විෂයන් 13 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.17,800,000 ක් වූ අතර, වියදම රු.8,923,753 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.8,876,247 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 31 සිට 88 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයන් 05 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.185,475,886 ක් වූ අතර, වියදම රු.121,965,905 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.63,509,981 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 30 සිට සියයට 59 දක්වා පරාසයක් ගෙන තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 208-2-2-0-2103 වැය විෂය යටතේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.180,000,000 ක් වූ අතර, වර්ෂයේ වියදම රු.180,000,000 ක් විය.එසේ වුවද, වර්ෂ අවසානයේදී ප්‍රතිපාදන ඉක්මවා රු.21,884,027 ක බැරකම් හා බැඳීම් වලට එළඹ තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඡේද අංක 03 හා 04 අනුව බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි දෙපාර්තමේන්තුව විසින් CIGAS ගිණුම්කරණ පද්ධතිය දෛනිකව යාවත්කාලීන කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නිතිරීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

නීති, රීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ අංක 3.1 මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 113 (6) හා මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) හා (ඒ)	2024 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සේවකයින්ගෙන් අයවිය යුතු රු.1,111,512 ක් වූ ණය ශේෂය වක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) 2024 ජූනි 02 දිනැති අංක අමප/24/1125/620/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණ අංක 31 (I) හා (II)	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රත්නපුර ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ලේ සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක PED/e-GP/Circular/2018 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ වක්‍රලේඛය සහ 2018 ඔක්තෝම්බර් 23 දිනැති අංක PED/e-GP/Circular/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වක්‍රලේඛය	වක්‍රලේඛ ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදනයන් සිදුකිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

(අ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් 2024 දෙසැම්බර් මස දක්වාත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ කෞතුකාගාර පද්ධතියම නියාමනය කිරීමේ අධිකාරී බලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පවත්නා නීතියට අදාළ සංශෝධනයන් කර කෞතුකාගාර ක්ෂේත්‍රයේ නියාමන බලය ලැබිය යුතු ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත එම බලය ලබා ගැනීමට ද ක්‍රියා කර නොතිබුණි.

(ආ) කෞතුකාගාර සම්බන්ධයෙන් වන ආචාර ධර්ම ICOM (International Council of Museums) ආයතනය විසින් කෞතුකාගාර විෂය ක්ෂේත්‍රය තුළ විශාල පරාසයක් ආවරණය වන පරිදි සකස් කර තිබෙන අතර, එම ආචාර ධර්ම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති රීති අණපත් හා ප්‍රතිපත්ති වලට ගැළපෙන අයුරින් කෙටුම්පත් කිරීම 2021 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර තිබුණු නමුත්, එම කටයුතු 2025 මැයි 14 දින වන විටත් අවසන් කර නොතිබුණි.

4.1.2 සැලැසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 03,04 ඡේදයන්හි විධිවිධාන ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය සමඟ එහි පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2024 වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම 2024 මාර්තු 04 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. 2024 වර්ෂය සඳහා අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අදාළ අනුමැතිය, මූල්‍ය ප්‍රකාශන වලට අනුමැතිය ලබාදුන් දිනය වන 2025 පෙබරවාරි 24 දිනයේම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ලබාදී තිබුණි. ඒ අනුව සංශෝධනයන් වලට අදාළ අනුමැතිය අදාළ අවස්ථාවේදී ලබා නොගෙන ක්‍රියාත්මක කිරීමෙන් පසුව ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබුණි.

4.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් රු.මිලියන 02 ක වටිනාකමට කොළඹ ජාතික කෞතුකාගාරයට නාම පුවරුවක් සකස් කිරීමට අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කොළඹ ජාතික කෞතුකාගාරයේ ජනේලයේ අළුත්වැඩියාව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත භූගත විදුලි රැහැන් යෙදීම, ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ වැහිපිලි අළුත්වැඩියාව සහ ලක්සල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම යන රු.මිලියන 7.213 ක් වටිනා ව්‍යාපති 04 ක් 2024 අනුමත ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොකර ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) කෞතුකාගාර පරිශ්‍රය වටා ඇති පෞරාණික ස්මාරක තාප්පය හා දැල් වැට අලුත්වැඩියාව, කොළඹ කෞතුකාගාරයේ වහල අළුත්වැඩියාව සහ අනුරාධපුර ජන කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි නවීකරණය යන ව්‍යාපති 03 හි ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 33 ක් වූ අතර, 2024 වර්ෂයේදී එම ව්‍යාපෘති වල වැඩ අවසන් කර නොතිබුණි.

(ඈ) වැය විෂය 208-2-3-0-2001-45/11 යටතේ රත්නපුර ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ල සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු සඳහා අයවැය මඟින් රු.110,000,000 ක් ප්‍රතිපාදන වෙන් කර පැවති අතර, පරිපූරක ඇස්තමේන්තු යටතේ රු.25,000,000 ක් ප්‍රතිපාදනද ලබාගෙන තිබූ නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) කෞතුක භාණ්ඩ භාරකාරිත්වය හා ආරක්ෂා කිරීම සම්බන්ධ ගැටලු, ඒවාට අදාළ ලිපිගොනු විධිමත්ව පවත්වා නොගැනීම, නිලධාරීන් වෙනස්වීමේදී භාණ්ඩ භාරකාරිත්වය නිසි පරිදි නොපැවරීම යනාදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා නිසා වර්ෂ 1877 සිට 1957 දක්වා කාලයට අදාළ කෞතුක භාණ්ඩ වර්ග 07 කට අයත් භාණ්ඩ අස්ථානගත වී තිබුණු අතර, මෙම අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 105 (2)(ඇ) විධි විධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ජෛව විද්‍යා මැදිරියට යාබඳව පවතින දෙවන මහලේ වම් පස කොටස මුළුමනින්ම වසා දමා 2012 වසරේ සිට මේ දක්වා මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කර තිබුණු අතර, අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට හෝ එලදායී වෙනත් කාර්යයකට මෙම කොටස භාවිතා කිරීමට 2024 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු අංක 32-1126 දරන රු.2,200,000 ක වටිනාකමින් යුත් ජීප් රථය 2020 ඔක්තෝම්බර් 05 දින සිට ධාවන තත්ත්වයේ නොපැවතුණු අතර, 2025 මාර්තු 25 විගණිත දින වන විටත් අළුත්වැඩියා කර ධාවනයට යොදවා නොතිබුණි. තවද වසර 05 කට ආසන්න කාලයක් මුළුල්ලේ නිශ්කාර්යව පැවතුණි.

4.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ නරඹන්නන් වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර ආදායම බැංකුගත කිරීමේදී සිදුවී ඇති සේවක අක්‍රමිකතාව පිළිබඳ 2022 වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණය මත සහ මුදල් රෙගුලාසි 104 (3) ප්‍රාරම්භක වාර්තාව අනුව දෙපාර්තමේන්තුවට අහිමි කර ඇති සමස්ථ ආදායම රු.1,652,605 ක් විය. මේ පිළිබඳව මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ පරීක්ෂණ වාර්තාවක් පරීක්ෂණයෙන් පසු අලාභය සිදු වූ දිනයේ සිට තුන් මාසයක් ඇතුළතදී ඉදිරිපත් කළ යුතු වුවත්, 2025 මාර්තු 26 විගණිත දින වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි. එසේම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) ගේ අංක ජා.කෞ.දෙ/ආ1/විග-1/ර.වී හා 2025 මාර්තු 26 දිනැති ලිපියට අනුව බුද්ධශාසන, අගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සඳහා 2024 ඔක්තෝබර් 23 දින මණ්ඩලයක් පත්කර ඇති නමුත්, එහි කටයුතු අවසන් කර නොතිබුණි.

4.4 පාඩු හා හානි

කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.4,440,140 ක් වූ කෞතුක භාණ්ඩ 221 ක් සොරකම් කිරීම සිදුවී 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12 ක කාලයක් ගත වී පැවති නමුත්, අවසන් තීරණය ලබාදීමට අවශ්‍ය නෛතික කාර්යයන් සහ එහි සමස්ථ පාඩුව හඳුනාගෙන ඊට අදාළව මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4.5 අනාර්ථික ගනුදෙනු

(අ) දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර මුද්‍රණයේදී, සෙසු කෞතුකාගාර 2022 සිට 2024 දක්වා වර්ෂ 03 ක කාලය තුළ සිදුකරනු ලැබූ සාමාන්‍ය වාර්ෂික ප්‍රවේශ පත්‍ර ඉල්ලීම් පිළිබඳව නොසලකා, එක් වරකදී ප්‍රවේශ පත්‍ර පොත් 500 සිට 2000 අතර තොග වශයෙන් ටිකට් පොත් මුද්‍රණය කර තිබුණි. දෙපාර්තමේන්තු වැය ලෙජය අනුව 2022 වර්ෂය තුළ ප්‍රවේශ පත්‍ර 100 ක් මුද්‍රණය වෙනුවෙන් රු.1,698,148 ක්ද, 2023 වර්ෂයේ ප්‍රවේශ පත්‍ර 3500 ක් මුද්‍රණය වෙනුවෙන් රු.2,576,061 ක් ලෙසට රු.4,274,259 ක ප්‍රතිපාදන වැයකර තිබුණි.

මෙලෙස සාමාන්‍ය ප්‍රවේශ පත්‍ර පිළිබඳ වාර්ෂික ඉල්ලීම් නොසලකා වැඩිපුර ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කිරීමට මුදල් වැය කිරීම අනාවර්තික වියදමක් බව නිරීක්ෂණය විය.

(ආ) විගණනය සිදු කරන ලද 2024 නොවැම්බර් 19 දිනයේදී නිකුත් නොවන නැරඹුම් ප්‍රවේශ පත්‍ර පොත් 10,673 ක තොගයක් භෞතිකව පැවතුණි. මෙම තොගය දෙපාර්තමේන්තුවේ ගබඩාවේ හා ගිණුම් අංශයේ අල්මාරි 10 කට ආසන්න ප්‍රමාණයක ගබඩා කර පැවති අතර, මේ සඳහා විශාල ඉඩකඩක් හා නිශ්කාර්ය ගබඩා පිරිවැයක් දරා ඇති බව හා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

එසේම නිකුත් නොවන නැරඹුම් ප්‍රවේශ පත්‍ර පොත් තොගයට අමතරව 2017 වර්ෂයේ මුද්‍රණය කළ නමුත්, පසුගිය වසර කිහිපයේ සිට නිකුත් නොකරන ලද අවලංගු කරන ලද දේශීය ළමා ටිකට් පොත් 380 ක් දෙපාර්තමේන්තු ගිණුම් අංශය තුළ ගබඩා කර පැවති අතර, ඒ සඳහා දරන ලද තනා වියදම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) ජාතික කෞතුකාගාර පුස්තකාලය තුළ වසර 150 කට වඩා පැරණි පොත් පත් එකතුවක් පවතින අතර, කාලාන්තරයක් මුළුල්ලෙහි සංරක්ෂණය කළ නොහැකි හා පරිහරණය කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති පොත් පත් රාශියක් විශාල ඉඩ ප්‍රමාණයක ගබඩා කර ඇති බව නිරීක්ෂණය විය. මෙලෙස විනාශ වී ඇති පොත් පත් පිළිබඳ පුස්තකාල අපහරණ ලේඛනයක්ද පුස්තකාල අංශය තුළ නොතිබුණි. අපහරණය කළ යුතු පොත්පත් පිළිබඳ අපහරණ මණ්ඩලයක් සහ ඊට අදාළ ප්‍රමිතින්ද සකස් කර නොතිබුණි.

(ආ) ගිනි ආරක්ෂණ පද්ධතියට සමගාමීව පුස්තකාලය තුළ වායු සමීකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, විදුලි පංකා කිහිපයක් පමණක් සවිකර පැවතුණි. වසර ගණනාවක් පැරණි පෞරාණික වටිනාකමකින් යුත් පොත් හා පුස්කොළ පොත් සුරක්ෂිතව තවත් අනාදිමත් කාලයක් දෙස් විදෙස් පාඨකයින්ට පරිහරණය කිරීම සඳහා අවස්ථා සලසා දීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වුවත්, මෙම ග්‍රන්ථ වල පැවැත්මට ප්‍රශස්ථ මට්ටමට පැවතිය යුතු විදුලි ආලෝකය වායු සමීකරණ තත්ත්වයන් මෙන්ම ආර්ද්‍රතාව පාලනයට අවශ්‍ය තාක්ෂණික උපකරණ භාවිතා නොකිරීම නිසා වටිනා ග්‍රන්ථ විනාශ වීමේ අවධානමක් පැවතුණි. එසේම පුස්තකාල පරිසරයක් තුළ පැවතිය යුතු සුවහපසු සේවා පරිසරයක් නොමැති වීම හා දැඩි දුවිලි සහිත තත්ත්වයක් පැවතීම හේතුවෙන් සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ශ්වසන රෝග හා චර්ම රෝග වලට ගොදුරු වීමට දැඩි ප්‍රවණතාවයක් පැවතුණි.

